සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 63 | S | I |
|---|---|---|

# දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ........................................ **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** කාලය : පැය 01යි.

වැදගත් :

- ✳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 සඳහා ලකුණු 40ක් හිමි වේ.
- ✳ ප්‍රශ්නයට අදාළව දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට පිළිතුරු සැපයීමට ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය තුළ (X) සලකුණ යොදන්න.

(01) භාණ්ඩ හා සේවා බිහි කිරීමේ ක්‍රියාවලියේ දී යොදාගන්නා නිෂ්පාදන සාධකයකි.
(1) බැංකුකරුවන් (3) ව්‍යවසායකයන්
(2) සැපයුම්කරුවන් (4) ගනුදෙනුකරුවන්

(02) සුනිමල් විසින් පාසල් සිසුන්ට භාවිතය සඳහා හඳුන්වා දුන් නව සෞඛ්‍යාරක්ෂිත පාසල් බෑගය නව අංග රැසකින් සමන්විත විය. තම පාසල් බෑගය රටේ සියලු ම පාසල් සිසුන් විසින් රැගෙන යනු දැකීම ඔහුගේ ප්‍රාර්ථනයයි. සුනිමල් සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ වන්නේ,
(1) නවෝත්පාදනය හා ස්වාධීනත්වයයි.
(2) සුබවාදී බව හා දැක්මක් සහිත බවයි.
(3) නවෝත්පාදනය හා දැක්මක් සහිත බවයි.
(4) අවදානම බාර ගැනීම හා දැක්මක් සහිත බවයි.

(03) තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම,
(1) නිර්මාණශීලීත්වයට බාධාකාරී සාධකයකි. (3) ස්වාධීනත්වයට බාධාකාරී සාධකයකි.
(2) නම්‍යශීලීත්වයට බාධාකාරී සාධකයකි. (4) ව්‍යවසායකත්වයට බාධාකාරී සාධකයකි.

(04) නවෝත්පාදනය සිදු වන ආකාරයකි,
(1) අනපේක්ෂිත සිදුවීමක් (3) වෙළඳපොළේ වෙනස්වීමක්
(2) අනුකරණය කිරීමක් (4) ක්‍රියාවලි අවශ්‍යතාවක්

(05) ව්‍යවසායකත්වය හා ව්‍යාපාර පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.
A - සියලු ව්‍යාපාර කටයුතු ලාභ අපේක්ෂාවෙන් සිදු කෙරේ.
B - ව්‍යවසායකයන් නවෝත්පාදන බිහිකිරීමෙන් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරයි.
C - සෑම ව්‍යාපාරිකයෙකුම ව්‍යවසායකයෙකු- නොවේ.
D - ව්‍යාපාරිකයන් අවදානමට මුහුණ දෙනු නොලැබේ.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A හා B (3) B හා C
(2) A හා D (4) A, B හා C

(06) අවශ්‍යතාවල දැකිය හැකි ලක්ෂණයකි.
(1) ද්විතියික වීම. (3) සියලු දෙනාටම පොදු වීම.
(2) පෞද්ගලිකත්වය අනුව විවිධ වීම. (4) ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකි වීම.

(07) වුවමනා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පාසල / තට්ටු නිවාස / දුරකථනය (3) විනෝදාංශ / රූපවාහිනිය / රෝහල
(2) අධ්‍යාපනය / ආරක්ෂාව / සන්නිවේදනය (4) නිල ඇඳුම් / අන්තර්ජාලය / නිවාස

(08) ව්‍යාපාරිකයා තුළ මෙන්ම ව්‍යවසායකයා තුළ ද දැකිය හැකි ලක්ෂණයකි.

(1) නවෝත්පාදනය.
(2) නිර්මාණශීලීත්වය.
(3) ආර්ථික කටයුත්තක යෙදීම.
(4) සුබවාදීව සිතීම.

(09) ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය කිරීමේ ක්‍රියාවලිය අයත් ව්‍යවසායකත්ව භූමිකාව වන්නේ,

(1) අයිතිකරු
(2) සේවකයා
(3) නායකයා
(4) කළමනාකරුවා

(10) ව්‍යාපාරයක් ආරම්භකොට පවත්වාගෙන යාම පිණිස යොදා ගන්නා සහ යොදා ගත හැකි සියලුම වාසිදායක සාධක,

(1) ශක්තීන් ලෙස හැඳින්වේ.
(2) නිෂ්පාදන සාධක ලෙස හැඳින්වේ.
(3) සම්පත් ලෙස හැඳින්වේ.
(4) ආරම්භන හැකියාව ලෙස හැඳින්වේ.

(11) නලීන් මිතුරෙකුගේ උපදෙස් මත ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එහෙත් තම නිෂ්පාදිත අලෙවි කිරීමට ප්‍රමාණවත් ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ව්‍යාපාරයට නොපැමිණීම නිසා කෙටි කලකින් ව්‍යාපාර කටයුතු නවතා දැමීමට ඔහුට සිදුවිය. සිද්ධියට අනුව නලින්ගේ ව්‍යාපාරය අසාර්ථක වීමට බලපෑ හේතුව විය හැක්කේ,

(1) ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම.
(2) ගනුදෙනු වාර්තා නොකිරීම.
(3) සම්පත් නිවැරදිව පාලනය නොකිරීම
(4) සැලසුමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

(12) ව්‍යාපාරයක් සාර්ථක ලෙස ඉදිරියට කරගෙන යාම සඳහා අවශ්‍ය තීරණ ගැනීම හා උපාය මාර්ග හඳුන්වාදීමට ව්‍යාවසායකයකු- සතු කුසලතාව හැඳින්වෙන්නේ,

(1) තාක්ෂණික කුසලතා ලෙස ය.
(2) උපදේශන කුසලතාව ලෙස ය.
(3) සංකල්පනාත්මක කුසලතාව ලෙස ය.
(4) සන්නිවේදන කුසලතාව ලෙස ය.

(13) නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) අවශ්‍යතා හා වුවමනා සරල වීම.
(2) තරඟකාරීත්වය අඩු වීම.
(3) කුඩා ප්‍රදේශයකට සීමා වීම
(4) වෙනස් වීමේ වේගය ඉතා ඉහළ වීම.

(14) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරයට අයත් සාධක කිහිපයකි.

A - සේවකයෝ B - ගනුදෙනුකරුවෝ
C - කළමනාකරුවෝ D - තරඟකරුවෝ
E - අයිතිකරුවෝ F - සැපයුම්කරුවෝ

ඉහත සාධක අතරින් ආසන්න පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් පිළිතුරු තෝරන්න.

(1) A, C හා E
(2) B, D හා F
(3) A, B හා C
(4) D, C හා F

(15) එක්තරා ව්‍යාපාරිකයෙකු වෙළෙඳපොළ පිළිබඳව සිදු කළ සමීක්ෂණයකින් හෙළිවූයේ අදාළ ප්‍රදේශයේ අඩු ආදායම් ලබන පවුල් සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින බවයි. මෙයට අදාළ වන බාහිර පරිසර සාධකය වන්නේ,

(1) ප්‍රජා පරිසරයයි.
(2) ආසන්න පරිසරයයි.
(3) දේශපාලන හා නෛතික පරිසරයයි.
(4) ගෝලීය පරිසරයයි.

(16) මැණික් කර්මාන්තය ඇතුළත් වන ව්‍යාපාර අංශය වන්නේ,

(1) තෘතියික අංශයයි.
(2) නිමැවුම් අංශයයි.
(3) ප්‍රාථමික අංශයයි.
(4) ද්විතීයික අංශයයි.

(17) නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සපයාගත හැකි මාර්ගයක් නොවන්නේ,

(1) ස්වකීය ඉතුරුම්
(2) බැංකු ණය
(3) වත්කම් විකිණීම
(4) උපයාගත් ලාභ

(18) නව ව්‍යාපාරිකයෙකු වෙළඳපොළට පිවිසීම සඳහා ප්‍රවේශ මාර්ගය ලෙස ''නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට සැපයීම'' තෝරා ගැනීමෙන් ලබා ගත හැකි සුවිශේෂී වාසිය වන්නේ,

(1) වැඩි ප්‍රාග්ධනයක් අවශ්‍ය නොවීමයි.
(2) ප්‍රවර්ධනය පහසු වීමයි.
(3) තරඟකරුවන් නොමැති වීමයි.
(4) වෙළඳපොළට පිවිසීම පහසු වීමයි.

(19) SCAMPER ආකෘතියට අනුව සීනි රහිත සිසිල් බීම වර්ග වෙළඳපොළට හඳුන්වා දීමේ ක්‍රමවේදය වන්නේ,
(1) ආදේශ කිරීමයි. (3) කුඩා කිරීමයි.
(2) ඉවත් කිරීමයි. (4) යළි සකස් කිරීමයි.

(20) ''වෙළඳපොළෙහි පාරිභෝගිකයන් ගෙන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා සහිතව පසු වන බව'' හැඳින්වෙන්නේ,
(1) වෙළඳපොළ අවශ්‍යතාවය ලෙසයි. (3) වෙළඳපොළ තරඟකාරීත්වය ලෙසයි.
(2) වෙළඳපොළ හිඩැස ලෙසයි. (4) වෙළඳපොළ ඛණ්ඩනය ලෙසයි.

(21) ව්‍යාපාර අදහස් අතරින් හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) හොඳ ව්‍යාපාර අදහසක් ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පැවැතිය යුතු ය.
(2) පාරිභෝගිකයන්ගේ වෙනස් වන අවශ්‍යතාවලට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට හැකි අදහසක් විය යුතු ය.
(3) තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීමට හැකි තාක්ෂණය සමඟ ගැළපෙන ව්‍යාපාර අදහසක් විය යුතු ය.
(4) සීඝ්‍රයෙන් වර්ධනය කළ හැකි, කෙටි කාලයක් තුළ උපරිම ලාභ ඉපයිය හැකි ව්‍යාපාර අදහසක් විය යුතු ය.

(22) ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණයකි.
(1) සුලභ නොවීම.
(2) බොහෝ අය දකින දෙයක් වීම.
(3) ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකි වීම.
(4) විවිධ මූලාශ්‍ර ඔස්සේ විශාල ප්‍රමාණයක් ජනනය වීම.

(23) ව්‍යාපාර ආයතනයක අභ්‍යන්තර පරිසරය තුළින් ජනනය වන ශක්තීන් පිළිබඳව අධ්‍යයනය කරනු ලබන්නේ,
(1) සාර්ව විශ්ලේෂණයේ දී ය. (2) ශදුඅත විශ්ලේෂණයේදී ය.
(3) සූක්ෂම විශ්ලේෂණයේදී ය. (4) වෙළඳපොළ විශ්ලේෂණයේ දී ය.

(24) ව්‍යාපාර සැලැස්ම පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සැලසුම පරිසරයේ සිදුවන වෙනස්වීම් අනුව වෙනස් කළ හැකි විය යුතු ය.
B - මුදල් හා අනෙකුත් වත්කම් ප්‍රමාණවත් පරිදි යෙදීමෙන් පමණක් සැලසුම් සාර්ථක කරගත හැකි ය.
C - ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමටත්, ව්‍යාපාර පිළිබඳව පසු විපරම් කිරීමටත් සැලසුම් අවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A හා B (3) A හා C
(2) A, B හා C (4) B හා C

(25) සුනිමල් මුළුතැන්ගෙයි උපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ඇරඹීමට බලාපොරොත්තු වන අතර එහි සුවිශේෂීතාවය ලෙස ඔහු ඉදිරිපත් කරන්නේ ජංගම ක්‍රමයට එම භාණ්ඩ අලෙවි කිරීමට බලාපොරොත්තු වන බවයි. මෙම සුවිශේෂීතාවය ඔහුගේ ව්‍යාපාර සැලැස්මේ කුමන මූලිකාංගය තුළ ඇතුළත් කළ යුතු ද?
(1) මූල්‍ය සැලැස්මේ (3) නිෂ්පාදන සැලැස්මේ
(2) පරිපාලන සැලැස්මේ (4) විධායක සාරාංශයේ

(26) පහත 'අ' හා 'ආ' නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| 'අ' | 'ආ' |
|---|---|
| (1) මූල්‍ය සැලැස්ම | A - වාර්ෂික අමුද්‍රව්‍ය අවශ්‍යතාව |
| (2) අලෙවි සැලැස්ම | B - සේවක අවශ්‍යතාව |
| (3) පරිපාලන සැලැස්ම | C - ප්‍රාග්ධන අවශ්‍යතාව |
| (4) නිෂ්පාදන සැලැස්ම | D - තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම |

(1) 1 - C, 2 - A, 3 - B, 4 - D (3) 1 - C, 2 - D, 3 - B, 4 - A
(2) 1 - B, 2 - A, 3 - C, 4 - D (4) 1 - C, 2 - D, 3 - A, 4 - B

(27) අලෙවි සැලැස්මේ පළමු පියවර වන්නේ,
(1) විකුණුම් පුරෝකථනයයි. (3) වෙළෙඳපොළ විශ්ලේෂණයයි.
(2) අලෙවි උපාය මාර්ග තීරණ කිරීමයි. (4) අලෙවි ආදායම හා වියදම තීරණය කිරීමයි.

(28) විකුණුම් පුරෝකථනයක් තුළින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ,
  (1) ඉලක්ක පරිභෝගිකයා හඳුනාගැනීමයි.
  (2) වෙළෙඳපොළේ දැනට සිටින තරඟකරුවන් හඳුනා ගැනීමයි.
  (3) ස්වකීය භාණ්ඩය හෝ සේවාවට දැනට පවතින ඉල්ලුම හා සැපයුම හඳුනා ගැනීමයි.
  (4) වෙළඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ප්‍රමාණය තීරණය කිරීමයි.

(29) ව්‍යාපාරයක් ප්‍රවර්ධනය සඳහා දරණ වියදම් එම ව්‍යාපාරයේ,
  (1) අලෙවි වියදමකි.
  (2) පරිපාලන වියදමකි.
  (3) නිෂ්පාදන වියදමකි.
  (4) ප්‍රාග්ධන වියදමකි.

● පහත දැක්වෙන්නේ බේකරි නිෂ්පාදන ආයතනයක බනිස් ගෙඩි 100ක් නිෂ්පාදනය කිරීම සඳහා යන දෛනික වියදම් ලැයිස්තුවයි. 30 සිට 35 දක්වා ප්‍රශ්න සඳහා එම තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| අයිතමය | ප්‍රමාණය | ඒකක මිල රු. |
|---|---|---|
| පාන් පිටි | 5kg | 110 |
| සීනි | 2kg | 100 |
| දර මිටි | 5 | 100 |
| සේවක වැටුප | 1 | 1000 |

(30) මෙම ව්‍යාපාරයේ දෛනික ද්‍රව්‍ය පිරිවැය ගණනය කරන්න.
  (1) රු. 600 (2) රු. 750 (3) රු. 1000 (4) රු. 1250

(31) මෙම නිෂ්පාදනයට වැය වන වෙනත් දෛනික වියදම් කොපමණ ද?
  (1) රු. 500 (2) රු. 750 (3) රු. 1000 (4) රු. 1250

(32) මෙම ව්‍යාපාරයේ මාසික ශ්‍රම පිරිවැය කොපමණ ද?
  (1) රු. 1000 (2) රු. 10000 (3) රු. 20000 (4) රු. 30000

(33) දෛනික මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
  (1) රු. 1000 (2) රු. 1250 (3) රු. 2250 (4) රු. 2500

(34) බනිස් ගෙඩියක් නිෂ්පාදනය සඳහා වැය වන මුදල ගණනය කරන්න.
  (1) රු. 17.50 (2) රු. 22.50 (3) රු. 25.50 (4) රු. 27

(35) බනිස් ගෙඩියක් රු. 30ක් ලෙස මිල කරයි නම්, දිනක ලාභය වන්නේ,
  (1) රු. 750 (2) රු. 850 (3) රු. 2250 (4) රු. 3000

(36) ව්‍යාපාර සැලැස්මක මූල්‍ය සැලැස්ම තුළින් ලබා ගත හැකි තොරතුරක් වන්නේ,
  (1) සේවක සංඛ්‍යාව.
  (2) නිෂ්පාදන පිරිවැය.
  (3) ව්‍යාපාරයේ සුවිශේෂීභාවය.
  (4) ව්‍යාපාරයේ අවසන් ප්‍රතිඵලය.

(37) ඇඟලුම් කම්හලක නිෂ්පාදන ස්ථාවර වත්කමක් විය හැක්කේ,
  (1) බෙදාහැරීමේ ලොරි රථය
  (2) මහන මැෂින්
  (3) අලෙවි ප්‍රදර්ශක කුටිය
  (4) කාර්යාලීය ලී බඩු

(38) ව්‍යාපාරයක් විසින් වත්කම් මිලට ගැනීම,
  (1) ආදායමකි.
  (2) ලාභයකි.
  (3) මුදල් ගලා ඒමකි.
  (4) මුදල් ගලා යාමකි.

(39) ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දැක්නට ලැබෙන ලක්ෂණයකි.
  (1) ආර්ථික කටයුත්තක යෙදීම.
  (2) ලාභය අරමුණු කර ගැනීම.
  (3) සමාජ සුභසාධන පෙර දැරිවීම.
  (4) හිමිකාරීත්වය පෞද්ගලික අංශය සතු වීම.

(40) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයකි.
  (1) සුපිරි වෙළඳසල
  (2) පෞද්ගලික පාසල්
  (3) රතු කුරුස සංවිධානය
  (4) නිමි ඇඳුම් අලෙවිහල

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 63 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : .......................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - II කාලය : පැය 02යි.

වැදගත් :
✳ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ප්‍රසන්න මහතා තමාගේම කියා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි ආශාවෙන් පසු විය. පාසල් අධ්‍යාපනයෙන් ඔහු ලද දැනුමට අනුව ව්‍යාපාරයක් කිරීමට පෙර පරිසර විශ්ලේෂණයක් කළ යුතු බව ඔහු දැන සිටියේ ය. ඒ අනුව රටේ පවතින ආර්ථිකය, ජනගහනය, නීතිමය තත්ත්වය, අපතේ යන ස්භාවික සම්පත් හා පවතින තාක්ෂණය පිළිබඳව අධ්‍යයනය කළේ ය. එහි දී කාන්තාවන් වැඩි පිරිසක් සේවා නියුක්ත වීම, වැඩිහිටි ජනගහනය ඉහළ යාම, දරුවන් රැක බලා ගැනීමට ක්‍රමයක් නොමැති වීම, භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම, ණය පොලී අනුපාතය ඉහළ මට්ටමක පැවැතීම, ණය ගැනීමේ දී ඉහළ සුරැකුම් ඉල්ලා සිටීම, මිනිසුන්ගේ කාර්යය බහුලත්වය හා අවිවේකී බව යනාදිය අනාවරණය කර ගත් කරුණුවලින් කීපයකි.

ප්‍රසන්න මහතා විසින් හඳුනාගත් තොරතුරු ඇසුරින්, තෝරාගත් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාව ව්‍යාපාරයක් බවට පත් කර ගැනීමට සකසන ලද ව්‍යාපාර සැලැස්මෙන් පළමු වර්ෂය සඳහා උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| භූමිය සකස් කර ගැනීම | 40,000 |
| ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම | 2,000 |
| උපකරණ ගැනීම | 20,000 |
| ලී බඩු ගැනීම | 30,000 |
| බැංකු ණය ගැනීම | 50,000 |
| හිමිකරු යෙදවුම් | 150,000 |
| විකුණුම් ආදායම් | 200,000 |
| සේවක වැටුප් | 100,000 |
| අමුද්‍රව්‍ය ගැනීම | 150,000 |
| විදුලි වියදම් | 25,000 |

ඉහත තොරතුරු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ප්‍රසන්න මහතා විසින් අධ්‍යයනය කරන ලද බාහිර පරිසර සාධක දෙකක් ලියන්න.

(ii) ඔබ විසින් නම් කරන ලද පරිසර සාධක දෙකට අදාළව ප්‍රසන්න විසින් රැස් කර ගත් තොරතුරු දෙක බැගින් ලියන්න.

(iii) ප්‍රසන්න විසින් හඳුනා ගත් තොරතුරු ඇසුරින් ඔහුට ආරම්භ කළ හැකි යැයි ඔබ යෝජනා කරන ව්‍යාපාර අවස්ථා දෙකක් ලියන්න.

(iv) රැස් කර ගත් තොරතුරුවලින් ප්‍රසන්න විසින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මුහුණදීමට සිදු වන තර්ජන දෙකක් ලියන්න.

(v) ප්‍රසන්න තුළින් පිළිබිඹු වන ව්‍යවසායකත්ව ගුණාංග දෙකක් ලියන්න.

(vi) ප්‍රසන්නගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලා ඒම ගණනය කරන්න.

(vii) ප්‍රසන්නගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලා යාම් ගණනය කරන්න.

(viii) වර්ෂය අවසානයේ ඇස්තමේන්තු ගත මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) ප්‍රසන්නගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදම් දෙකක් ලියන්න.

(x) ප්‍රසන්නගේ ව්‍යාපාරය සඳහා යෙදවීමට නියමිත ස්ථාවර වත්කම් දෙකක් ලියන්න.

(ලකුණු 2x10=20)

(02) (i) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 2ක් සඳහන් කරන්න.

(ii) ඔබ ප්‍රදේශයේ හෝ පාසලේ මතු වී ඇති ගැටලුවක් සඳහන් කර ඒ සඳහා ගත හැකි නිර්මාණශීලී විසඳුමක් සඳහන් කරන්න.

(iii) දූව මේසයක් නිෂ්පාදනය කිරීමට අදාළ යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය ඇඳ දක්වන්න.

(iv) දූව මේසයක් සකස් කිරීම සඳහා යෙදවුම් ලෙස ඔබ භාවිතයට ගත් ස්ථාවර වත්කම් දෙකක් සඳහන් කරන්න.

(v) පුද්ගලයකු-ගේ නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2x5=10)

(03) (i) දේශපාලන හා නෛතික පරිසරයට අයත් සාධක දෙකක් ලියන්න.

(ii) වර්තමාන ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ව්‍යවසායකයකුට අත් කරගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

(iii) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකම් හතරක් ලියන්න.

(iv) ශීඝ්‍රයෙන් වෙනස් වන පරිසරය තුළ පුළුල්වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති නව ප්‍රවණතා හතරක් සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයකුට සමාජ සුබ සාධනය සඳහා දායක විය හැකි ක්‍රම හතරක් ලියන්න.

(ලකුණු 2x5=10)

(04) (i) පේටන්ට් බලපත්‍රයක් පිරිනැමීම සඳහා නව සොයාගැනීමක් ලෙස සලකණු ලබන අයිතම දෙකක් ලියන්න.

(ii) ව්‍යවසායකයකු-ට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අනුගමනය කළ හැකි සාර්ථක පිවිසුම් උපාය මාර්ග දෙකක් ලියන්න.

(iii) යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම සඳහා සිදු කරන සූක්ෂම විශ්ලේෂණයේ දී භාවිතයට ගනු ලබන නිර්ණායක හතරක් සඳහන් කරන්න.

(iv) ව්‍යවසායකයකු-ට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර හතරක් ලියන්න.

(v) ව්‍යවසායකයෙක් විසින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ගත යුතු තීරණ හතරක් ලියන්න.

(ලකුණු 2x5=10)

(05) (i) මූල්‍ය සැලැස්මක් පිළියෙළ කිරීමෙන් ව්‍යවසායකයෙකුට අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ii) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදම් දෙකක් ලියන්න.

(iii) මූල්‍ය සැලැස්මක අන්තර්ගත වන කොටස් හතරක් ලියන්න.

(iv) ව්‍යාපාරයක් විසින් පිළියෙළ කරන ලද පරිපාලන සැලැස්මක අන්තර්ගත විය හැකි අනෙකුත් පරිපාලන වියදම් වර්ග හතරක් ලියන්න.

(v) පරිපාලන සැලැස්මක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2x5=10)

(06) (i) ව්‍යාපාර ආයතනයකට දැරීමට සිදුවන විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් වර්ග දෙකක් ලියන්න.

(ii) ව්‍යවසායකයකු විසින් සිදු කරනු ලබන වෙළඳපොල විශ්ලේෂණයක දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(iii) අලෙවිකරණ මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් (4Ps) නම් කරන්න.

(iv) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත වන විධායක සාරාංශයේ අතුළත් විය යුතු කරුණු හතරක් ලියන්න.

(v) ව්‍යාපාරිකයෙක් විසින් පරිභෝගික ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා අනුගමනය කරන ප්‍රවර්ධන උපක්‍රම හතරක් ලියන්න. (ලකුණු 2x5=10)

(07) * පහත දැක්වෙන්නේ ''යසසිරි රසකැවිලි'' ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මක් 2020 වර්ෂය සඳහා උපුටා ගන්නා ලද තොරතුරු ය.

| | රු. |
|---|---|
| විකුණුම් ආදායම | 500,000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 125,000 |
| ශ්‍රම පිරිවැය | 150,000 |
| පරිපාලන වියදම් | 12,000 |
| ණය පොලිය | 10,000 |
| බැංකු ණය | 100,000 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 13,000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 15,000 |
| කොමිස් ආදායම් | 20,000 |
| අයිතිකරුගේ යෙදවුම් | 300,000 |

ඉහත තොරතුරු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) 2020 වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය පිළියෙළ කරන්න. (ලකුණු 6)

(ii) ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනයේ මූලික වශයෙන් ඇතුළත් වන කරුණු 2ක් ලියන්න.

(iii) යසසිරි ව්‍යාපාරයේ ප්‍රතිඵල ගණනය කිරීම සඳහා නොගැනෙන අයිතම දෙකක් ලියන්න. (ලකුණු 2)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

63 S I,II

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 4 | (21) - 4 | (31) - 1 |
| (2) - 3 | (12) - 3 | (22) - 1 | (32) - 4 |
| (3) - 1 | (13) - 4 | (23) - 2 | (33) - 3 |
| (4) - 2 | (14) - 2 | (24) - 3 | (34) - 2 |
| (5) - 3 | (15) - 1 | (25) - 4 | (35) - 1 |
| (6) - 3 | (16) - 4 | (26) - 3 | (36) - 4 |
| (7) - 1 | (17) - 4 | (27) - 3 | (37) - 2 |
| (8) - 3 | (18) - 3 | (28) - 4 | (38) - 4 |
| (9) - 4 | (19) - 2 | (29) - 1 | (39) - 1 |
| (10) - 1 | (20) - 2 | (30) - 2 | (40) - 3 |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

(01) (i)
- ආර්ථික පරිසරය
- නෛතික පරිසරය / දේශපාලන හා නෛතික පරිසරය
- ප්‍රජා පරිසරය
- ස්වභාවික පරිසරය

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි.)

(ii)
- **ආර්ථික පරිසරය**
- භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම
- ණය පොලී අනුපාතය ඉහළ මට්ටමක පැවතීම
- ණය ගැනීමේ දී ඉහළ සුරැකුම් ඉල්ලා සිටීම
- **ප්‍රජා පරිසරය**
- ජනගහනය
- කාන්තාවන් වැඩි පිරිසක් සේවා නියුක්ත වීම
- දරුවන් රැක බලා ගැනීමට ක්‍රමයක් නොමැති වීම
- වැඩිහිටි ජනගහනය ඉහළ යාම
- මිනිසුන්ගේ කාර්ය බහුලත්වය හා අවිවේකී බව
- **ස්වභාවික පරිසරය**
- අපතේ යන ස්වාභාවික සම්පත්

(එක් පරිසරයක අදාළව කරුණු 2ක් සැපය යුතු අතර එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4ක් සඳහා ලකුණු 2යි.)

(iii)
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන
- වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන
- ආහාර සැකසුම් මධ්‍යස්ථාන
- පුහුණු ගෘහනියන් සැපයීමේ ආයතන

(ගැළපෙන පිළිතුරකට ලකුණු 1 බැගින් පිළිතුරු 2කට ලකුණු 2යි)

(iv)
- ණය පොලී අනුපාතය ඉහළ යාම
- ණය ගැනීමේ දී ඉහළ සුරැකුම් අපේක්ෂා කිරීම.
- භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(v)
- ස්වාධීනත්වය
- දැඩි ආශාව
- පරිසර සංවේදී බව

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(vi)
- හිමිකරු යෙදවුම් 150,000
- බැංකු ණය ගැනීම් 50,000
- විකුණුම් ආදායම 200,000

මුළු මුදල් ගලා ඒම් 400,000

(නිවැරදි පිළිතුරට ලකුණු 2යි)

(vii)
- භූමිය සැකසීමට 40,000
- ව්‍යාපාර නාමය ලියාපදිංචියට 2,000
- උපකරණ ගැනීමට 20,000
- ලී බඩු ගැනීමට 30,000
- සේවක වැටුප් 100,000
- අමුද්‍රව්‍ය ගැනීම 150,000
- විදුලි වියදම් 25,000

මුළු මුදල් ගලා යාම් 367,000

(නිවැරදි පිළිතුරට ලකුණු 2යි)

(viii)
- මුළු මුදල් ගලා ඒම් 400,000
- මුළු මුදල් ගලා යාම් (367,000)

කාලච්ඡේදය අවසානයේ

මුදල් ශේෂය 33,000

(නිවැරදි පිළිතුරට ලකුණු 2යි)

(ix)
- භූමිය සකස් කර ගැනීමට
- ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට

(එක් පිළිතුරකට ලකුණු 1 බැගින් පිළිතුරු 2කට ලකුණු 2යි.)

(x)
- උපකරණ
- ලී බඩු

(එක් පිළිතුරකට ලකුණු 1 බැගින් පිළිතුරු 2කට ලකුණු 2යි.)

(02) (i) **අවශ්‍යතා**
- මූලිකව පැන නගියි.
- සීමිතය.
- සියලු දෙනාට ම පොදු ය.
- උප්පත්තියක් සමඟ ඇති වේ.

**වුවමනා**
- ද්විතීකව පැන නගියි.
- අසීමිතය.
- පෞද්ගලිකය.
- ව්‍යාපාරිකයින් නිර්මාණය කරයි.

(සන්සන්දනාත්මක පිළිතුරකට ලකුණු 1 බැගින් පිළිතුරු 2කට ලකුණු 2යි.)

(ii) (ගැළපෙන පිළිතුරකට ලකුණු 2යි.)

(iii) යෙදවුම් → පරිවර්තන ක්‍රියාවලිය → නිමැවුම්

යෙදවුම් වර්ග 4ක් (ලකුණු 1යි)

(පරිවර්තන ක්‍රියාවලියේ පියවර 2ක් (1/2))

දූව මේසය (1/2))

(ගැළපෙන පරිදි පිළිතුරකට ලකුණු 2ක් පිරිනමන්න.)

(iv) (ගැළපෙන පිළිතුරකට ලකුණු 1 බැගින් පිළිතුරු 2කට ලකුණු 2යි)

(v)
- විවිධත්වය ග්‍රහණය කර ගැනීම.
- අසාර්ථකත්වය ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම.
- ගැටලු අභියෝග ලෙස දැකීම
- නිර්මාණශීලීත්වය පුහුණු අවස්ථාවට යොමු වීම.
- නිර්මාණශීලිත්වය අගය කිරීම මගින්
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම.

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි.)

(03) (i)
- අන්තර් ජාතික ගිවිසුම්
- විදේශ වෙළඳාම
- රාජ්‍ය ප්‍රතිපත්ති
- නීතිරීති

(එක් කරුණකට ලකු-ණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(ii)
- ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනාගත හැකි වීම.
- ව්‍යාපාර සතු දුර්වලතා හඳුනාගත හැකි වීම.
- ව්‍යාපාර අවස්ථා හඳුනාගත හැකි වීම.
- ව්‍යාපාරයට පවතින තර්ජන හඳුනාගත හැකි වීම.
- පරිසර වෙස්වීම්වලට අනුව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා හැකි වීම.

(එක් කරුණුකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(iii)
- ආර්ථික කටයුත්තක යෙදීම.
- අවදානමට මුහුණදීම
- ගනුදෙනුවලට නිරතවීම.
- සම්පත් භාවිත කිරීම.
- තරගයට මුහුණදීම
- පැවැත්ම ගැන සිතීම
- ස්වයං පෙළඹීමක් තිබීම.

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි.)

(iv)
- නව තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතය
- පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා යොමු වීම.

- පරිසර හිතකාමී බලශක්ති ජනනය
- ගෝලීයකරණය

(ගැළපෙන කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි.)

(v) (ගැළපෙන කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි.)

(04) (i)
- නව නිපැයුමක්
- නව යන්ත්‍රයක්
- නව ක්‍රියාවලියක්
- ඉහත කරුණුවල සංකලනයක්
- පවත්නා ක්‍රියාවලියට වැඩි දියුණු කිරීමක්

(එක් කරුණුකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි.)

(ii)
- සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාවක් වීම.
- නිෂ්පාදන ප්‍රභේදනය
- වෙළඳපොළ හිඩැස / අවකාශය
- නවෝත්පාදනය

(කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(iii)
- වෙළඳපොලක් පැවතීම
- අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව
- අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගත හැකි බව
- රජයේ දිරිදීමන්වීම් හා නීතිරීති, ප්‍රතිපත්ති
- ව්‍යවසායකයාගේ දැනුම, පළපුරුද්ද කුසලතා සහ ඇල්ම
- ශ්‍රමය සපයා ගැනීමේ පහසුව
- පවතින අවදානම
- දියත් කිරීමේ පහසුව

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(iv)
- විනෝදාංශ හා ලැදියා තුළින්
- පුද්ගල දක්ෂතා හා පලපුරුද්ද තුළින්
- වෙළඳපොල සමීක්ෂනය තුළින්
- නිර්මාණශීලී චින්තන හැකියාව තුළින්
- ජන මාධ්‍ය මගින්
- සැපයුම්කරුවන් ඇසුරින්
- තරගකාරීත්වය අධ්‍යයනය තුළින්
- අධ්‍යාපන හා පුහුණු පාඨමාලා තුළින්
- ප්‍රදර්ශන හා අත්දැකීම් තුළින්

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(v)
- ව්‍යාපාරය සඳහා කොතරම් කැපවිය හැකි ද?
- ව්‍යාපාරය සඳහා පදනම් වන භාණ්ඩ හෝ සේවා කුමක්ද?
- ඉලක්කගත පරිභෝගිකයා කවුරුන්ද?
- තරගයේ ස්වභාවය කෙබඳුද?
- ප්‍රාග්ධන සපයා ගන්නේ කෙසේ ද යන්න
- තනිව හෝ හවුල් ව්‍යාපාරය ආරම්භ කරනවා ද?
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය
- සමාජයට කවර ප්‍රතිලාභයක් අත්කර දිය හැකි ද?

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(05) (i)
- ව්‍යාපාරයට අවශ්‍ය කරන අරමුදල් ප්‍රමාණය තීරණය කර ගැනීම
- පැනනැඟිය හැකි මූල්‍ය ගැටලු අවම කර ගැනීමට
- ව්‍යාපාරයේ ප්‍රතිඵල දැන ගැනීමට
- ප්‍රතිඵල ප්‍රමාණවත් ද යන්න දැන ගැනීමට

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(ii)
- වෙළඳපොල සමීක්ෂණ වියදම්
- ස්ථානය සංවර්ධනය සඳහා වියදම්
- අමුද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍ය දෑ පිළිබඳව සොයා බැලීමට යන වියදම්
- ලියාපදිංචිය සඳහා යන වියදම්
- ව්‍යාපාර සැලැස්ම සැකසීමට යන වියදම්
- ආරම්භක දින උත්සව වියදම්

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(iii)
- ව්‍යාපාරය ආරම්භ කිරීමටට පෙර සිදු කරන කාර්යයන් හා වියදම්
- මුළු ආයෝජන ඇස්තමේන්තුව
- අපේක්ෂිත මුදල් ගලා යාමේ හා මුදල් ගලා ඒම් ලේඛනය
- ව්‍යාපාරයේ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(iv)
- ගොඩනැගිලි දුරකථන වියදම්
- දුරකථන වියදම්
- ලිපිද්‍රව්‍ය වියදම්
- පරිපාලන ස්ථාවර වත්කම් ක්ෂය

- පරිපාලන ස්ථාවර වත්කම් නඩත්තු වියදම්
- වරිපනම් බදු
- කාර්යාල විදුලි වියදම්

  (ගැළපෙන එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(v) ව්‍යාපාරය අවශ්‍ය කරන මානව සම්පත් පිළිබඳව තොරතුරු හා පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කරන කොටස පරිපාලන සැලැස්ම ලෙස හැඳින්වේ.

(නිවැරදි අදහස ඇති පිළිතුරට ලකුනු 2යි.)

(06) (i)
- ප්‍රචාරණ වියදම්
- වෙළඳ සේවක වැටුප්
- බෙදාහැරීම් රථය ක්ෂය
- දුන් වට්ටම්

  (එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(ii)
- ස්වකීය භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම
- ඉලක්කගත පාරිභෝගිකයා පිළිබඳව
- තරගකරුවන් පිළිබඳව

  (එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි)

(iii)
- නිෂ්පාදිතය
- ස්ථානය
- මිල
- ප්‍රවර්ධනය

  (එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(iv)
- ව්‍යාපාරයේ නම
- කර්මාන්තය ක්ෂේත්‍රය
- අලෙවිකරණ සැලැස්මේ වැදගත් කරුණු කෙටියෙන්
- නිෂ්පාදන සැලැස්මේ වැදගත් කරුණු කෙටියෙන්
- පරිපාලන සැලැස්මේ වැදගත් කරුණු කෙටියෙන්
- මූල්‍ය සැලැස්මේ වැදගත් කරුණු කෙටියෙන්
- ව්‍යාපාර සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමේ පරමාර්ථ හා අරමුණු

  (එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

(v)
- ජංගම දුරකථන හරහා කෙටි පණිවිඩ සේවාව (SMS)
- ගනුදෙනුකරුවන් පෞද්ගලිකව මුණගැසී නිෂ්පාදිත ඉදිරිපත් කිරීම.
- අන්තර්ජාල හරහා
- රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් අත්පත්‍රිකා

  (ගැළපෙන කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 2යි)

''යසසිරි ව්‍යාපාරය''

(07) (i) 2020 වර්ෂය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛණය (1/2)

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම් | 500 000 (1/2) | | |
| කොමිස් ආදායම් | 20 000 (1/2) | 520 000 (1/2) | |
| අඩුකලා : මුළු නිෂ්පාදන පිරිවැය | | | |
| අමුද්‍රව්‍ය පිරිවැය | 125 000 (1/2) | | |
| ශ්‍රම පිරිවැය | 150 000 (1/2) | | |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 15 000 (1/2) | 290 000 | |
| අඩුකලා : මුළු නිෂ්පාදන නොවන පිරිවැය | | | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 13 000 (1/2) | | |
| පරිපාලන වියදම් | 12 000 (1/2) | | |
| මූල්‍ය වියදම් | 10 000 (1/2) | 35 000 | |
| | | 195 000 | (1/2) |
| අපේක්ෂිත ශුද්ධ ලාභය (1/2) | | | |

(ලකුණු 06)

(ii)
- ඇස්තමේන්තුගත මුළු ආදායම
- ඇස්තමේන්තුගත මුළු වියදම
- අපේක්ෂිත ප්‍රතිඵලය

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි.)

(iii)
- බැංකු ණය
- අයිතිකරු යෙදවුම්

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 2කට ලකුණු 2යි.)